## බක්මහේ අසිරිමත් මංගල්ලය මෙවරත් ඩැන්ඩිනොන් ප්‍රදර්ශන ක්‍රීඩාංගනයේදී

මව්බිමෙන් වෙන්ව දුරු රටක ජීවත් වුවත් බක්මහ උදා වෙන්නේ සිරිමත් සිංහල අවුරුදු හැඟීමෙන් අප සිත් සතන් වෙලා ගනිමිනි. වම් බිමේදී මෙන් අවුරුදු පණිවිඩය රැගෙන එන කොහාගේ හඬ අප සවන් නොවැටුණත් ගිම්හානයක රශ්මි ධාරා ගෙවී යන්නේ තවත් සිංහල හා හින්දු අලුත් අවුරුද්දක් සැමරීමට ශ්‍රී ලාංකික අපට ආරාධනා කරමිනි. කවුම් කොකිස් මුං අලුවා රස රතිඤ්ඤා ඔංචිලි වාරම් මැද මේ සියලු දේ සමග නෑ සනුහරය හා අසල්වාසීන් අතර එදා අත්විඳි ඒ අසිරිමත් අවුරුදු හැඟුම් අප ජීවිත වලින් කෙසේ වෙන් කළ හැකි ද? ඒ නිසාම ලොව කොයි දේශයක ජීවත් වුවත් අඩුම තරමින් දූ දරුවන් හිතවතුන් හෝ එක් කරගෙන හැකි අයුරින් මෙම සුන්දර මංගල්ලය සැමරීමට අපි පසුබට නොවෙමු.

කරුණු කෙසේ වුවත් මෙල්බන් නුවර ජීවත්වන ශ්‍රී ලාංකික අපි නොඅඩුව මෙම සිංහල අලුත්අවුරුදු පහස ලබා ගන්නට තරම් වාසනාවන්තයෝ වෙවු. පුංචි ශ්‍රී ලංකාවක් මෙන් ශ්‍රී ලාංකිකය-න් විශාල පිරිසක් ජීවත්වන මෙහි අවුරුදු නැකත් චාරිත්‍ර වත්පිළිවෙත් වලට කෑම පිසීම හිස තෙල් ගෑම පුණ්‍ය කාලය තුළ පන්සල් වැඳ පුදා ආසිරි ලබා ගැනීම වැනි සියලුම දේ ඉෂ්ඨ සිද්ධ වීම දකින්න ලැබෙයි. ඒ සියල්ලටම වඩා මෙල්බන් පුරවර සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන මහා බක්මහ උළෙල සුවිශේෂී එකකි.

දශක තුනකට කිට්ටු අතීතයක් කරා ඇදී යන මෙම බක් මහ උළෙල පිළිබඳ කරුණු කීම ඉ.ා වැදගත් වෙයි. විදේශයක අඛණ්ඩව පවත්වන විශාලම බක් මහ උළෙල වන මෙම උළෙල ඔබ වෙනුවෙන් සංවිධානය කරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය මෙවරත් අවුරුදු උළෙල සංවිධානය ගැන ගෙන එන කරුණු ඔබ වෙත ඉදිරිපත් කිරීම වැදගත් වෙයි. මුලින්ම සංගමයේ සභාපති සී අපොන්සු මහතා කරුණු දක්වමින් -මෙවරත් මෙල්බන් වාසී ඔබ සියලු දෙනා වෙනුවෙන් බක් මහ උලෙල ඉතා සාර්ථකව ගෙන එන්නට අවශ්‍ය සියලු කටයුතු ලහි ලහියේ ලක ලෑස්ති කරමින් සිටින බව කියන්න කැමතියි. මෙම දැවැන්ත උළෙල සංවිධානය කිරීමේදී සුලු හෝ අඩුපාඩුවක් නොමැතිව සිංහල අවුරුදු පහස ඔබ වෙන ගෙන ඒමට කළ යුතු බොහෝ දේ නිලධාරි මණ්ඩලය හා සාමාජිකයන්ගෙන් සැදුම් ලත් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් කෙරෙන කටයුත්තක්. 1994 සිට අඛණ්ඩව සංගමය විසින් සංවිධානය කරනු ලබව මෙම උළෙල වර්ණවත් කර ගැනීමට මෙල්බන් වාසී අනුග්‍රාහක හවතුන් පුවත්පත් ගුවන් විදුලි හා රූපවාහිණී වැනි මාධ්‍ය ආයතන වලින් ලැබෙන සහයෝගය ඉතා ඉහළින් අගය කළ යුතුයි. එලෙසම මෙම උළෙලට නොකඩවා සහභාගි වෙමින් අපත් සමග එක් වී අවුරුදු සමරණ ඔබෙන් ලැබෙන සහයෝගයත් ඉතා අගය කළ යුතු දෙයක් ලෙස මම දකිනවා. මෙම 18 වෙනි ඉරිදා ඩැන්ඩිනොන් ප්‍රදර්ශන ක්‍රීඩාංගනයේදී 2010 බක් මහ උළෙල සැමරීමට ඔබ සැමට කාරුණිකව ආරාධනය කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා"

තව දුරටත් කරුණු දැක්වූ සංගමයේ උපසභාපති චන්ද්‍රවංශ මහතා මෙල්බන් නුවර වැඩිම ශ්‍රී ලාංක-කයන් පිරිසක් එක්ව පවත්වන උත්සවය ලෙස මෙය හඳුන්වන්න පුලුවන්. ඒ නිසාම ඔබ සැම අපහසුතාවට පත් නොවන අයුරින් ආරන්ෂාවට අවශ්‍ය සියලුම දේ ඔවුන් මේ වන විටත් සංවිධානය කර තිබෙන බවත් මේ ආරක්ෂක සංවිධාන අතර විශේෂ පොලිස් ඒකකයයක් හා ප්‍රථමාධාර ඒකකයක් ද වන බවත් ඔහු විශේෂයේන සඳහන් කළේ ය.

සංගමයේ හිටපු සභාපතිවරයකු වන ශාන්ත නානායක්කාර මහතා -මෙම උත්සවයට මෙල්බන් නුවර දස අතින් ඇදී එන රථවාහන කිසිවකුට හා උළෙලට හානියක් නොවන අයුරින් ක්‍රමාණුකූලව රථ ගාල් වලට යැවීමට අවශ්‍ය පහසුකම් ඉතා සුපරික්ෂාකාරීව සැපයීමට සිය සාමාජිකයන් පිරිසක් යොදා තිබෙන බවත් ඒ නිසා මං මාවත් අවහිර වී ඔබට හෝ උත්සවයට බාධාවක් නොවන අයුරින් කටයුතු කිරීමට ඒ සඳහා යොදවා ඇති නිලධාරීන්ගේ මග පෙන්වීම අනුගමනය කර එම කාර්යයට සහයෝගය දෙන මෙන් ඉල්ලා සිටියේ ය.

ඇවිදීමට අකමැත්තක් නැති අය වෙනුවෙන් ඩැන්ඩිනොන් හෝ සැන්ඩවුන් දුම්රිය පොළේ සිට පා ගමනින් වුවද මෙම ක්‍රීඩාංගනයට පැමිණිය හැකි බවද සඳහන් කළ යුතු ය.

මා මෙතෙක් වේලාවක් දැනගන්නට පුල පුලා බලා සිටි අදහසක් පිටවුණේ සංගමයේ හිටපු සභාපතිවරයකු වන අමරසිංහ අමුණුගම මහතා ගේ මුවිනි.

"ඔබ දන්නවා මෙම බක්මහා උළෙලේ දී අප ඔබ වෙනුවෙන් පිළියෙල කරන අවුරුදු කෑම මේසය. මම හිතන විදියට මෙය ලෝකයේ පිළීයෙල වන




විශාලතම අවුරුදු මේසය වෙන්නත් පුලුවන්. මම එහෙම කියන්නේ උදේ අවුරුදු මේසයට සහභාගිවන සියලු දෙනාටම ඇතිවන්නට කැවුම් කොකිස් කිරිබත් ආස්මි මුං කැවුම් ආදී මෙකී නොකී සෑම සිංහල කෑම වර්ගයකින්ම සමන්විතව මෙය ඔබ වෙනුවෙන් පිළියෙල වන නිසයි. එහි රස බලන්නත් එක්කම උදෙන්ම පැමිණෙන මෙන් අපි ඔබට ආරාධනා කරන්න කැමතියි.. එදා 1994 වසරේ අප ගැන විශ්වාසයෙන් මෙම උත්සවය සංවිදානය කිරීමට අපට අවස්ථාව සළසා දුන් පිරිස ගැනත් සිහිකිරීමට කැමතියි. ඔවුන් දහ දොළොස් දෙනෙක්ම ජීවිත කාලයක් මෙම උත්සවය අඛණ්ඩව 1994 දක්වා පැමිණීම වෙනුවෙන් මෙල්බන් නුවර ශ්‍රී ලාංකිකයන් සමග එක් වී අපේ ප්‍රණාමය ඔවුන්ට පුද කිරීමට මා මෙය අවස්ථාව කරගන්නවා"

තව දුරටත් කෑම බීම ගැන කතා කිරීමට මා සමග එක්වූයේ සංගමයේ තවත් හිටපු සභාපතිවරයකු වන ජයන්ත ප්‍රනාන්දු මහතායි. -මුල් අවධියේදී අපි බක් මහ උළෙලට සහභෘගිවන සියලු දෙනාටම දිවා ආහාරය නොමිලේ සැපයීමට කටයුතු කළත් පසු කළෙක සෞඛ්‍ය ආරක්ෂක හේතු මත සංගමයේ සාමාජිකයන්ගේ නවෙස් වල පිසින ලද ආහාර ඔබ වෙත ලබා දීමට නීතිමය බාධාවක් පැන නැගුණා. නමුත් දවස පුරා අපත් සමග අවුරුදු අසිරිය විඳින ඔබට බාදාවකින් තොරව එවෙලේමෙ උණු උණුවේ සකස් කරන ලද දිවා ආහාරපාන පහසු මිලට ලබා ගැනීමට අවශ්‍ය සියලුම පහසුකම් අප සපයන බවත් දන්වන් කැමතියි. ඒ වගේම ක්‍රීඩා වලට සහභාගිවන සැමට ආරක්ෂා කාරී අන්දමින් අවශ්‍ය අංගෝපාංග සකස් කරන බවද මතක් කර දෙන්න කැමතියි."

පිටියේ තරග ගැන සිහිපත් කළ සැණින් කවදත් එම කටයුතු සංවිධානය කරන ජගත් කොතලාවල මහතා -සිඟිති දරු දැරියන්ගේ සිට වැඩිහිටියන් දක්වා සියලු වයස් සීමාවන්ට සරිලන පරිද්දෙන් දවස පුරා විනෝද විය හැකි තරග රාශියක් සංවිදා-නය කර තිබෙනවා. ශ්‍රී ලාංකික අපට උරුමව තිබෙන ජන ක්‍රීඩා සහ වෙනත් අවුරුදු ක්‍රීඩා බො-හොමයකට සහභාගි වීමට මෙල්බන් වාසී ශ්‍රී ලාංකික සැමට අවස්ථාව සළසා දෙමින් අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කර තිබෙනවා. එමෙන්ම ඔස්ට්‍රේලියාවේ හැදෙන වැඩෙන දූ දරුවන්ගේ අවධානය අපේ සංස්කෘති දෑ කෙරෙහි යොමු

